# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1466 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 24/11/2023<br>පැය 1025 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### ශ්‍රී ලංකා පොලිසියට කරාතේ තරඟ ජයග්‍රහණයක් හිමිවීම - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය







ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයට අනුබද්ධ JSKA කරාතේ දෝ සම්මේලනය (Japan Shothokan Karate Association) විසින් සංවිධානය කරන ලද "2023 JSKA විවෘත අන්තර්ජාතික කරාතේ තරඟාවලිය" 2023.11.18 වන දින බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

ඉහත තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය සහ බංගලාදේශය යන රටවල් නියෝජනය කරමින් ත්‍රිවිධ හමුදාව ඇතුළු කරාතේ සංගම් 20 ක් නියෝජනය කරමින්

ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 746 දෙනෙකු පමණ සහභාගී වූ අතර, ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 24 දෙනෙකු ද සහභාගී වී පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

මෙහිදී, කුම්තේ සහ කාතා ඉසව් වලින් රන් පදක්කම් 19 ක්ද, රිදී පදක්කම් 06 ක්ද, ලෝකඩ පදක්කම් 03 ක්ද හිමි කරගෙන ඇති අතර කණ්ඩායම් කුම්තේ ඉසව්වේ හා කණ්ඩායම් කාතා ඉසව්වේ ශූරතාවයද තරඟාවලියේ **සමස්ථ ශූරතාවයද ශ්‍රී ලංකා පොලිස් කරාතේ කණ්ඩායම** හිමි කරගන්නා ලදී.

ශ්‍රී ලංකා පොලිස් ආත්මාරක්ෂක සටන් කලා සංගමයේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ඒ.ජී.ජේ. චන්ද්‍රකුමාර මහතාද, පොලිස් කරාතේ සංගමයේ ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජී.ජී.එස්. ගුණතිලක මහතාද කටයුතු කරනු ලබන අතර, පොලිස් කරාතේ කණ්ඩායම් නායක ලෙස පොලිස් පරීක්ෂක රජීව් ප්‍රසන්න, පොලිස් කරාතේ කණ්ඩායමේ කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක ඩබ්.පී. චතුරංග යන නිලධාරීන් සහ පුහුණුකරු ලෙස ජාතික පුහුණුකරු එම්.එන්. ජුරම්පති මහතා කටයුතු කරනු ලබයි.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**